ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

**<u>සුළුතර ප්‍රජාවන් නියෝජනය කරන තරුණ තරුණියන් සඳහා සංවිධාන වර්ධනය සහ විශිෂ්ටත්වය සඳහා නව්‍ය නායකත්වය පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වේ</u>**

**<u>(2026 ජූලි 13 – 17)</u>**

ශ්‍රී ලංකාවේ විවිධ දේශපාලන පක්ෂ 14ක සුළුතර ප්‍රජාවන් නියෝජනය කරන තරුණ තරුණියන් 30 දෙනෙක් 2026 ජූලි 13 – 17 දක්වා නොයිඩා හි ව්‍යවසායකත්වය සහ කුඩා ව්‍යාපාර සංවර්ධන ජාතික ආයතනයේ (NIESBUD) පැවති සංවිධාන වර්ධනය සහ විශිෂ්ටත්වය සඳහා නව්‍ය නායකත්වය පිළිබඳ පුහුණු වැඩසටහනක් සඳහා සහභාගී වූහ. කුසලතා සංවර්ධන සහ ව්‍යවසායකත්ව අමාත්‍යාංශය යටතේ පවතින NIESBUD ආයතනය ව්‍යවසායකත්වය සහ කුසලතා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා පුහුණුව, උපදේශකත්වය සහ පර්යේෂණ යනාදිය සම්බන්ධයෙන් කටයුතු කරන ප්‍රමුඛ පෙළේ ආයතනයකි.

2. මෙම වැඩසටහන සඳහා ව්‍යවසායකයන්, දේශපාලන නියෝජිතයන්, සමාජ නායකයන්, අධ්‍යාපනඥයන් සහ සංවිධානවල විවිධ තනතුරු හොබවන්නන් සහභාගී වූ අතර එම වෘත්තීය විවිධත්වයට ගැලපෙන පරිදි වැඩසටහන සංවිධානය කර තිබීම විශේෂත්වයක් විය. ගතික සහ විකසනය වන පරිසරයක් තුළ සංවිධාන සහ ප්‍රජාවන්ට නායකත්වය දීම සඳහා ඔවුන් නූතන උපාංග සහ රාමු මෙන්ම ප්‍රායෝගික ප්‍රවේශයන්ගෙන් ද සවිබල ගැන්වීම මෙමගින් සිදු කෙරිණ.

3. මෙම වැඩසටහනේ අරමුණ වූයේ සහභාගිවූවන්ගේ පරිවර්තනීය නායකත්ව හැකියාවන් ශක්තිමත් කිරීම, සැලසුම් චින්තනය හරහා නිර්මාණාත්මක චින්තනය සහ ගැටලු විසඳීමේ කුසලතා වර්ධනය කිරීම, තත්ත්වානුරූප නායකත්ව හැකියාවන් දියුණු කිරීම, පුහුණු කිරීම සහ මාර්ගෝපදේශනය, චිත්තවේගීය බුද්ධිය සහ ස්වයං නායකත්වය වර්ධනය කිරීම, සේවක නියැලීම් වර්ධනය කිරීම සහ සහයෝගී සංවිධාන සංස්කෘතියක් ගොඩනැගීම, වෙනස්කම් කළමනාකරණය කරමින් නවෝත්පාදනයන් ඉදිරියට ගෙන යාම සඳහා ප්‍රායෝගික උපායමාර්ගවලින් සහභාගිවූවන් සන්නද්ධ කිරීම, ඉන්දියාවේ නායකත්ව භාවිතයන් සහ සංවර්ධන වැඩසටහන් පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබාදීම

මෙන්ම තම සංවිධාන සහ ප්‍රජාවන් තුළ ලබාගත් දැනුම හා කුසලතා ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් සකස් කිරීමට ඔවුන්ට හැකියාව ලබාදීමයි.

4. මෙම වැඩසටහනට ටාජ් මහල් සහ අග්‍රා බලකොටුව වැනි සංස්කෘතික චාරිකා ද ඇතුළත් වූ අතර, ඒවා මගින් සහභාගිවූවන්ට ඉන්දියාවේ සංස්කෘතික උරුමය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට, අවිධිමත් ලෙස තම සගයින්ගෙන් ඉගෙන ගැනීමට සහ අන්තර්සංස්කෘතික අවබෝධය වර්ධනය කර ගැනීමට හැකි විය.

5. මෙය 2025 අප්‍රේල් මාසයේ ශ්‍රී ලංකාවේ සිදු කළ නිල සංචාරය අතරතුර ඉන්දිය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මහතා විසින් ශ්‍රී ලාංකික වෘත්තිකයන් සඳහා වාර්ෂිකව විශේෂයෙන් සකස් කළ පුහුණු අවස්ථා 700ක් ලබාදෙන බවට කළ නිවේදනයට අනුව ක්‍රියාත්මක කරන ලද්දකි.

***

*කොළඹ*
*2026 ජූලි 20*